ශ්‍රී ලංකා මහ බැංකුව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 101 වගන්තියේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදී.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යයසාධනය සහ මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතීන් යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් පාලක මණ්ඩලයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම පාලක මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම පාලක මණ්ඩලයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා බැංකුව විසින් පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී. ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ පාලක මණ්ඩලය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා පාලක මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව බැංකුව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව බැංකුව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මුදල් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 අප්‍රේල් 20 දින බැංකුව විසින් නිකුත් කළ මාධ්‍ය නිවේදනය අනුව, 2023 අප්‍රේල් 11 දින ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු අතරතුරේදී, මහබැංකුවේ අභ්‍යන්තරයේ වූ සුරක්ෂිතාගාරයක් තුළ රු.මිලියන 5 ක් (රුපියල් 5,000 නෝට්ටු) වටිනාකමක් සහිත නෝට්ටු ඇසුරුමක (බණ්ඩලයක) අඩුවීමක් අනාවරණය වී තිබුණි. මේ සම්බන්ධව අභ්‍යන්තර විමර්ශනයක් වහා අරඹන ලද අතර, කොටුව පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම නෝට්ටු ඇසුරුමක (බණ්ඩලයක) අඩුවීම සඳහා වගකිව යුතු කිසිදු පාර්ශවයක් තවමත් හඳුනාගෙන නොතිබුණි.	අභ්‍යන්තර පරීක්ෂණය අවසන් කර ඇති අතර, නිර්දේශ බොහොමයක් ක්‍රියාත්මක කර ඇත. අභ්‍යන්තර පරීක්ෂණයට අනුව, හිඟයට වගකිව යුතු පුද්ගලයෙකු හඳුනා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට නොහැකි විය. තවද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) සහ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව (CID) විසින් වෙනම පරීක්ෂණ දෙකක් පවත්වනු ලැබේ.	ඉතිරි නිර්දේශ ක්‍රියාත්මක කිරීම කඩිනම් කළ යුතු අතර, වගකිවයුතු පුද්ගලයා/පුද්ගල යින් හඳුනාගෙන ඔවුන් වගවීමට සැළැස්වීමට අවශ්‍ය පියවර ගත යුතුය.

1.6 තොරතුරු තාක්ෂණ (IT) පොදු පාලන ක්‍රම

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**යල් පැන ගිය තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය (අනුවාදය 5.0)** ශ්‍රී ලංකා මහ බැංකුව තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති අනුවාදය 5.0 යටතේ ක්‍රියාත්මක වන අතර එය අවසන් වරට සමාලෝචනය කරන ලද්දේ 2022 පෙබරවාරි මාසයේදීය. වත්මන් ප්‍රතිපත්තිය (i) වරප්‍රසාද ලත් පරිශීලක ගිණුම් නිරීක්ෂණය කිරීමේ ක්‍රියා පටිපාටි, (ii) පරිශීලක ගිණුම් නිර්මාණය සහ අක්‍රිය කිරීම සඳහා මාර්ගෝපදේශ සහ (iii) විකුණුම්කරු ආශ්‍රිත අවදානම් කළමනාකරණය ඇතුළු තීරණාත්මක ක්ෂේත්‍ර කිහිපයක් ප්‍රමාණවත් ලෙස ආවරණය නොකරයි.	යාවත්කාලීන කරන ලද තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය (අනුවාදය 6) 2025 ඔක්තෝබර් 1 වන දින තොරතුරු තාක්ෂණ අධීක්ෂණ කමිටුවට ඉදිරිපත් කරන ලද අතර පාලක මණ්ඩලයේ අනුමැතිය මත ක්‍රියාත්මක වනු ඇත. 2022 සිට මේ දක්වා කාලය තුළ, ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු (CISO) බඳවා ගැනීම, සයිබර් ආරක්ෂක පාලන රාමුවක් සකස් කිරීම, වරප්‍රසාද ප්‍රවේශ අධීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ ආරක්ෂක සිදුවීම් අවස්ථා කළමනාකරණ පද්ධතියක්	වරප්‍රසාදිත ප්‍රවේශය, පරිශීලක ගිණුම් කළමනාකරණය සහ විකුණුම්කරු අවදානමට අදාළ සියලු තීරණාත්මක ක්ෂේත්‍ර ප්‍රමාණවත් ලෙස ආවරණය කර ඇති බව සහතික

	මෙම විධිවිධාන නොමැති වීම අනවසර ප්‍රවේශය, වංචාව, දත්ත කඩකිරීම්, අනුකූලතා උල්ලංඝනය කිරීම් සහ තීරණාත්මක ව්‍යාපාරික ක්‍රියාවලීන් බාධා කිරීමේ අවදානම වැඩි කරයි. එපමණක් නොව, යාවත්කාලීන ප්‍රතිපත්ති රාමුවක් නොමැතිව, පාර්ශවකරුවන්ට නිසි මග පෙන්වීමක් සහ වගවීමක් නොමැති විය හැකි අතර, එමගින් මූල්‍ය දත්ත සහ ව්‍යාපාරික යෙදුම්වල රහස්‍යභාවය, අඛණ්ඩතාව සහ ලබා ගැනීමේ හැකියාව අවදානමට ලක් විය හැකිය.	ප්‍රසම්පාදනය කිරීම ආරම්භ කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය සයිබර් ආරක්ෂණ ස්ථාවරය ශක්තිමත් කර ඇත. ඊට අමතරව, තාක්ෂණික පරිගණක හදිසි තත්ත්ව සූදානම් කණ්ඩායම විසින් පවත්වන ලද SWIFT පාරිභෝගික ආරක්ෂක වැඩසටහනෙහි උපදේශන තක්සේරුවේ නිර්දේශ ක්‍රියාත්මක කර ඇති අතර, තාක්ෂණික පරිගණක හදිසි තත්ත්ව සූදානම් කණ්ඩායම විසින් අනුකරණය කරන ලද සයිබර් සිදුවීම් ප්‍රතිචාර අභ්‍යාසයක් සිදු කර ඇති අතර, ස්පෑම් (Spam) සහ තතුබෑම් (phishing) සිදුවීම් වාර්තා කිරීම සඳහා කැපවූ විද්‍යුත් තැපැල් ලිපිනයක් ස්ථාපිත කර ඇති අතර, පරිමිතිය ආරක්ෂක විශ්ලේෂණ මෙවලම් නිරන්තර අධීක්ෂණය ආරම්භ කිරීමත් සමඟ, හඳුනාගත් ආරක්ෂක සිදුවීම් කඩිනම් අවම කිරීමට හැකිවී ඇත.	කරමින්, තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය තවදුරටත් ප්‍රමාදයකින් තොරව යාවත්කාලීන කර අනුමත කළ යුතුය.
(ආ)	**දත්ත කාන්දු වීම වැළැක්වීමේ යාන්ත්‍රණයක් නොමැතිකම** අභ්‍යන්තරව සහ බාහිරව සම්ප්‍රේෂණය වන සංවේදී තොරතුරු කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා බැංකුව සතුව තත්‍ය කාලීන අධීක්ෂණ යාන්ත්‍රණයක් නොමැති බව නිරීක්ෂණය විය. එවැනි යාන්ත්‍රණයක් නොමැති විට, බැංකුව හිතාමතා සහ නොදැනුවත්ව දත්ත කාන්දු වීමේ අවදානමට නිරාවරණය වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රහසිගත තොරතුරු අනවසර පාර්ශවයන් වෙත සම්ප්‍රේෂණය විය හැකිය. සංවේදී ව්‍යාපාරික තොරතුරු සහ පුද්ගලික දත්ත ප්‍රමාණවත් ලෙස ආරක්ෂා කර නොමැති බැවින්, මෙම දුර්වලතාවය දත්ත කඩකිරීම්, නියාමන අනුකූල නොවීම, කීර්ති නාමයට හානි වීම සහ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය නැතිවීමේ අවදානම වැඩි කරනු ලබයි.	ඩිජිටල් අන්තර්ගතයන් සහ අයිතිවාසිකම් කළමනාකරණය සඳහා මයික්‍රොසොෆ්ට් තොරතුරු පාලන හා ආරක්ෂක වේදිකාව (Microsoft Purview) හරහා තොරතුරු වර්ගීකරණය සක්‍රීය කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දත්ත කාන්දු ආරක්ෂණ (DLP) පියවර ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. පොදු වේදිකා හරහා අන්තර්ගත බෙදාගැනීම සීමා කිරීම සඳහා ෆයර්වෝල් වල වෙබ් සහ යෙදුම් පාලන ප්‍රතිපත්ති ස්ථාපිත කර ඇති අතර, ගොනු හුවමාරු ප්‍රොටෝකෝල බලයලත් සේවාදායකයන්ට සීමා වේ. අභ්‍යන්තර දත්ත නිරාවරණය සහ පාර්ශ්වීය චලනය සීමා කිරීම සඳහා ජාල ඛණ්ඩනය සහ කලාපකරණය ක්‍රියාත්මක වෙමින් පවතී. මීට අමතරව, සහායක පද්ධති සහ යටිතල පහසුකම් ක්‍රියාත්මක වෙමින් පවතින අතර, දත්ත කාන්දු ආරක්ෂණ සිදුවීම් අඛණ්ඩව නිරීක්ෂණය කිරීම, තර්ජන හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීම වැඩි දියුණු කිරීම සඳහා 24*x*7 SOC සේවා සහිත SIEM විසඳුමක් ප්‍රසම්පාදනය කිරීම සිදු වෙමින් පවතී.	අනවසර දත්ත සම්ප්‍රේෂණය ඵලදායී ලෙස හඳුනා ගැනීම සහ වැළැක්වීම සහතික කිරීම සඳහා තත්‍ය කාලීන අධීක්ෂණ යාන්ත්‍රණයක් සහිත පුළුල් දත්ත කාන්දු ආරක්ෂණ (DLP) විසඳුමක් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර ඒකාබද්ධ කළ යුතුය.
(ඇ)	බැංකුව විසින් AS400 - විශ්‍රාම වැටුප්, eHRNet සහ LGS පද්ධති සඳහා ආපදා ප්‍රතිසාධන (DR) අඩවියක් ස්ථාපිත කර ඇති අතර පද්ධති ප්‍රතිනිර්මාණය ක්‍රියාත්මක වුවද, මෙම පද්ධති ආපදා	AS400 - විශ්‍රාම වැටුප්, eHRNet සහ LGS පද්ධති සඳහා බැංකුව සතුව ආපදා ප්‍රතිසාධන (DR) අඩවියක් ඇති අතර 2013 සිට ආපදා ප්‍රතිසාධන අඩවියට අනුකරණය කර ඇත.	බාධා කිරීම් අතරතුර ආපදා ප්‍රතිසාධන විධිවිධානවල

	ප්‍රතිසාධන අභ්‍යාසවලට ඇතුළත් කර නොමැත. වරින් වර පරීක්ෂා කිරීම් සිදු කර නොතිබීම ආපදා ප්‍රතිසාධන විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට ඇති සහතිකය සීමා කරන අතර එමඟින් තීරණාත්මක මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාමට සහ කාලෝචිත ලෙස යථා තත්ත්වයට පත් කිරීමට අවදානමක් ඇති කරනු ලබයි.		කාර්යක්ෂමතාව සහ තීරණාත්මක මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා AS400 - විශ්‍රාම වැටුප්, eHRNet සහ LGS පද්ධති සඳහා වරින් වර ආපදා ප්‍රතිසාධන (DR) අභ්‍යාස පැවැත්විය යුතුය.
(ඈ)	**iGLAS, SimCorp, NRMS, RTGS, CIMM, CMS, CMS EDI, OEBS, AS400 - විශ්‍රාම වැටුප්, eHRNet, LSS, FLMS, LGS සහ OMO SYS පද්ධති සඳහා පරිශීලක ප්‍රවේශ සමාලෝචන, පද්ධති ජනනය කරන ලද වෙනස් කිරීමේ ලොග් සහ වරප්‍රසාදිත පරිශීලක ගිණුම් අධීක්ෂණ කාර්යය නොමැති වීම.** iGLAS, SimCorp, NRMS, RTGS, CIMM, CMS, CMS EDI, OEBS, AS400 - Pension, eHRNet, LSS, FLMS, LGS සහ OMO SYS ඇතුළු තීරණාත්මක පද්ධති සඳහා බැංකුව ප්‍රධාන තොරතුරු තාක්ෂණ සාමාන්‍ය පාලනයන් ක්‍රියාත්මක කර නොමැත. විශේෂයෙන්, (i) ප්‍රවේශ අයිතිවාසිකම් දැඩි ලෙස "දැනගත යුතු" සහ "කළ යුතු" පදනමක් මත ලබා දෙන බව සහතික කිරීම සඳහා වරින් වර පරිශීලක ප්‍රවේශ සමාලෝචන සිදු කර නොමැත, (ii) මෙම පද්ධති තුළ සිදු කරන ලද සියලුම වෙනස් කිරීම් නිරීක්ෂණය කිරීමට සහ සාක්ෂි දීමට පද්ධතිය-ජනනය කරන ලද වෙනස් කිරීමේ ලොග් නඩත්තු කර නොමැත, සහ (iii) යෙදුම්, දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති මට්ටම්වල වරප්‍රසාද ලත් පරිශීලක ගිණුම් අධීක්ෂණ කාර්යයන් ස්ථාපිත කර නොමැත. මෙම තීරණාත්මක පාලනයන් නොමැතිකම අනවසර ප්‍රවේශය, අනාවරණය නොවූ පද්ධති වෙනස්කම්, වරප්‍රසාදිත අයිතිවාසිකම් අනිසි ලෙස භාවිතා කිරීම සහ වගවීමකින් තොරව දත්ත හැසිරවීමේ විභව අවදානම වැඩි කරන අතර එමඟින් බැංකුව සැලකිය යුතු මෙහෙයුම්, මූල්‍ය සහ කීර්ති නාම අවදානම් වලට නිරාවරණය වේ.	2026 පළමු කාර්තුවේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර පරිශීලක ප්‍රවේශ සමාලෝචන සිදු කරනු ලැබේ. අලුතින් බඳවා ගත් අය (දැනටමත් තෝරා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර ඇති) ඔවුන්ගේ අනෙකුත් රාජකාරිවලට අමතරව මෙම කාර්යයන් පවරනු ලැබේ. පද්ධතියෙන් ජනනය කරන ලද වෙනස් කිරීමේ ලොග් නොමැති වුවද, අවදානම අවම කිරීම සඳහා බැංකුව iGLAS, SimCorp, NRMS, RTGS, CIMM, CMS, CMS EDI, OEBS, AS400 – Pension, eHRNet, LSS, FLMS, LGS සහ OMO SYS ඇතුළු තීරණාත්මක පද්ධති සඳහා අත්සන් සහිත ප්‍රමිතිගත අත්පොත ආකෘති භාවිතා කරමින් නිසි වෙනස් කිරීමේ ඉල්ලීම් ක්‍රියා පටිපාටිය අනුගමනය කළේය. මෙම කාර්තුව තුළ වරප්‍රසාදිත ප්‍රවේශ නිරීක්ෂණ (PAM) පද්ධතිය ක්‍රියාත්මක කෙරේ.	පද්ධති ප්‍රවේශය, වෙනස්කම් සහ වරප්‍රසාද ලත් ක්‍රියාකාරකම් පිළිබඳ ඵලදායී පාලනය සහතික කිරීම සඳහා වරින් වර පරිශීලක ප්‍රවේශ සමාලෝචන, පද්ධති-ජනනය කරන ලද වෙනස්වීම් ලොග් සහ වරප්‍රසාද ලත් පරිශීලක ගිණුම් නිරීක්ෂණය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කර නිතිපතා නඩත්තු කළ යුතුය.

(ඉ)	**ලංකා සෙකියුර් සිස්ටම් සඳහා දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති මට්ටමේ විගණන ලොග් නොමැති වීම.** ලංකා සෙකියුර් පද්ධතිය තුළ දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති මට්ටමේ විගණන ලොග් සක්‍රීය කර නොමැත. එවැනි ලොග් නොමැති විට, නිශ්චිත පරිශීලක ගිණුම් මඟින් සිදු කරන ලද ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමට සහ ආරෝපණය කිරීමට කළමනාකරණයට නොහැකි වන අතර, අනවසර හෝ සැක සහිත ක්‍රියා අනාවරණය නොවී යාමේ අවදානම වැඩි කරයි. දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති මට්ටම් දෙකෙහිම, පරිශීලක ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීමට සහ තොරතුරු තාක්ෂණ පරිසරය තුළ වගවීමට සහාය වීමට විගණන ලොග් තීරණාත්මක විමර්ශන පාලනයකි. එබැවින් පාලන පරිසරය ශක්තිමත් කිරීම සහ පද්ධති ප්‍රවේශය සහ භාවිතය ඵලදායී ලෙස නිරීක්ෂණය කිරීම සහතික කිරීම සඳහා මෙම ලොග් සක්‍රීය කිරීම සහ නිතිපතා සමාලෝචනය කිරීම අත්‍යවශ්‍ය වේ.	2025 සිව්වන කාර්තුවේදී නව සේවාදායක පද්ධති ලබා දී පිහිටුවන විට මෙම දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති මට්ටමේ විගණන ලොග් සක්‍රීය කිරීමේ ශක්‍යතාව තක්සේරු කෙරේ.	පරිශීලක ක්‍රියාකාරකම්වල ඵලදායී අධීක්ෂණය සහ වගවීම සහතික කිරීම සඳහා දත්ත සමුදාය සහ මෙහෙයුම් පද්ධති මට්ටමේ විගණන ලොග් සක්‍රීය කර නිතිපතා සමාලෝචනය කළ යුතුය.
(ඊ)	**සාමාන්‍ය පරිශීලක ගිණුම් ලබා ගැනීමේ හැකියාව - OMO සහ OEBS පද්ධති** OMO පද්ධතියේ සහ OEBS පද්ධතිවල ක්‍රියාකාරී සාමාන්‍ය පරිශීලක ගිණුම් පවතී. මෙම ගිණුම් නිශ්චිත සේවක අංකවලට සම්බන්ධ නොවන අතර සාමාන්‍ය නම් යටතේ පවත්වාගෙන යනු ලබන අතර, එමඟින් නිසි හිමිකාරිත්වයක් සහ වගවීමක් නොමැත. එවැනි ගිණුම් පැවතීම, හඳුනාගත් පරිශීලකයෙකු වෙත ඒවා සොයා ගැනීමට නොහැකිව අනවසර හෝ නුසුදුසු ගනුදෙනු සිදු කිරීමේ අවදානම වැඩි කරයි. මෙම තත්ත්වය වගවීම දුර්වල කිරීම, විගණන ප්‍රවේශයන් අඩාල කිරීම, සහ පද්ධතියට ප්‍රවේශය අනිසි ලෙස භාවිතා කිරීමට බැංකුව නිරාවරණය කිරීම සිදුකරනු ලබයි. එබැවින්, කළමනාකාරිත්වය සාමාන්‍ය පරිශීලක ගිණුම් වහාම සමාලෝචනය කර අක්‍රිය කිරීම සහ සියලු පද්ධති ප්‍රවේශය සුදුසු අවසරයක් ඇති හඳුනාගත හැකි පුද්ගලයින්ට පවරා ඇති බව සහතික කිරීම වැදගත්ය.	මෙම නිරීක්ෂණයට විසඳුම් ලබා දෙන නව OMO පද්ධතියක් 2026 පළමු කාර්තුවේදී හඳුන්වා දෙනු ලැබේ. 2025 අවසානයේ පරිශීලක ප්‍රවේශ සමාලෝචනය සම්පූර්ණ කෙරේ.	OMO පද්ධතියේ සහ OEBS පද්ධතිවල ඇති සියලුම සාමාන්‍ය පරිශීලක ගිණුම් සමාලෝචනය කර අක්‍රිය කළ යුතු අතර, පද්ධති ප්රවේශය සුදුසු අවසරය ඇති හඳුනාගත හැකි පුද්ගලයින්ට පමණක් පවරා ඇති බව සහතික කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 274.8 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ ශුද්ධ අලාභය රු. බිලියන 114.4 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු. බිලියන 389.2 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට 2023 දී දේශීය ණය ප්‍රශස්තිකරණය (DDO) සම්බන්ධයෙන් ආදායමට එරෙහිව එක් දිනක් තුළ රුපියල් බිලියන 766.4 ක අලාභයක් අය කිරීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද, 2024 දී විදේශ මුදල් මූල්‍ය වත්කම් වලින් ඉහළ පොලී ආදායමක් වාර්තා විය.

2.2 ප්‍රවණතා විශ්ලේෂණය

(අ) ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ බැංකුවේ ප්‍රධාන ආදායම් විෂයයන් සහ ප්‍රධාන වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත දක්වා ඇත.

	2024	2023	විචලනය {හිතකර/(අහිතකර)}	
	රු. බිලියන	රු. බිලියන	රු. බිලියන	ප්‍රතිශතය %
විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම	**110.5**	**86.2**	**24.3**	**28.2**
පොලී ආදායම	45.9	18.0	27.9	155
උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභය / (අලාභය)	36.2	29.2	7	24
මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ ලාභය /(අලාභය)	28.4	39.0	(10.6)	(27.2)
විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්	**83.1**	**142.6**	**(59.5)**	**(41.7)**
පොලී වියදම්	81.4	142.5	(61.1)	(42.9)
ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය/ (පාඩුව)	**41.4**	**140.1**	**(98.7)**	**(70.4)**
දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත මුළු ශුද්ධ ආදායම	**227.4**	**(186.4)**	**413.8**	**222**
වෙනත් ආදායම්	1.5	1.6	(0.1)	(6.2)
වෙනත් වියදම්	0.4	3.5	3.1	(88.6)
මෙහෙයුම් වියදම්	22.5	9.8	12.7	129.6
බදු	**-**	**-**	**-**	**-**
වර්ෂය සඳහා ලාභය (අලාභය)	**274.8**	**(114.4)**	**389.2**	**340.2**

(ආ) ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 95 වන වගන්තියට අනුව තීරණය කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා බෙදා හැරිය හැකි අලාභය ඉකුත් වර්ෂයේ රු. බිලියන 313.74 ක බෙදා හැරිය හැකි අලාභයට සාපේක්ෂව රු. බිලියන 50.63 ක් විය. 2024 දී බෙදා හැරීම සඳහා ලාභයක් නොමැති වීම හේතුවෙන්, සංචිතවලට මාරු කිරීම, රු.බිලියන 15.82 ක රජයේ බැඳීම් අයකර ගැනීම, සහ ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම සිදු නොකෙරේ.

(ඇ) බැංකුවේ ශේෂපත්‍ර අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

(i) බැංකුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, භාණ්ඩාගාර බිල්පත් තබා ගැනීම 2023 අවසානයේ රු. බිලියන 208 (පොත් වටිනාකම) සිට 2024 අවසන් වන විට ශුන්‍ය වී ඇත. කෙසේ වෙතත්, බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය 2023 අවසානයේ රු.බිලියන 1,836 (පොත් වටිනාකම) සිට 2024 අවසානයේ රු.බිලියන 1,748.8 (පොත් වටිනාකම) දක්වා අඩු විය. දේශීය ණය ප්‍රශස්තිකරණ (DDO) මුලපිරීමේ කොටසක් ලෙස, 2023 සැප්තැම්බර් 21 වන දින බැංකුව ශ්‍රී ලංකා රජයට සිය තාවකාලික අත්තිකාරම් සහ රජයෙන් කලින් මිලදී ගත් භාණ්ඩාගාර බිල්පත් පිළිවෙලින් රුපියල් බිලියන 345 ක් සහ රුපියල් බිලියන 2,368 ක් ලෙස ප්‍රතිව්‍යුහගත කරන ලද අතර ඒවා ක්‍රමයෙන් අඩුවන ස්ථාවර කූපන් පොලියක් ලැබෙන නව භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් බවට පරිවර්තනය කරන ලදී. මෙම විධිවිධානය යටතේ, DDO යටතේ බැංකුව විසින් අත්පත් කරගත් භාණ්ඩාගාර බිල්පත් සඳහා 2024 පෙබරවාරි සිට 2024 සැප්තැම්බර් දක්වා කල්පිරීමේ දිනයන් තිබූ අතර, නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර සඳහා 2024 අවසානය දක්වා සියයට 12.4 ක, 2026 අවසානය දක්වා සියයට 7.5 ක සහ 2027 සිට කල් පිරෙන දිනය දක්වා සියයට 5.0 ක පියවර කූපන් අනුපාත තිබුණි. ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2023 වර්ෂයේදී රු.බිලියන 766.4 ක "එක්දින පාඩුවක්" සිදුවූයේ ගනුදෙනු මිල නව උපකරණවල සාධාරණ වටිනාකමට වඩා වෙනස් වූ බැවිනි.

(ii) බැංකුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, බැංකුවේ විදේශ වත්කම්වල වටිනාකම 2023 වසර අවසානයේ පැවති රු. බිලියන 1,703.6 සිට 2024 වසර අවසානයේ රු. බිලියන 1,998.4 දක්වා රු.බිලියන 294.8 කින් හෙවත් සියයට 17.3 කින් වැඩි වී තිබුණි. බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද සතිපතා ආර්ථික දර්ශකවලට අනුව, 2021 අගෝස්තු මාසයේදී බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් රු.බිලියන 83.9 ක සෘණ ශේෂයක් වාර්තා කිරීමට පටන් ගෙන තිබුණි. මෙම සෘණ ශේෂය 2022 දෙසැම්බර් මාසය අවසන් වන විට රු. බිලියන 1,613.9 දක්වා වැඩි වී තිබුණි. කෙසේ වෙතත්, එය 2023 දෙසැම්බර් අග වන විට රු. බිලියන 837.3 දක්වා අඩු වී තිබූ අතර 2024 දෙසැම්බර් අග වන විට මෙම සෘණ ශේෂය රු. බිලියන 222 දක්වා වැඩි වී තිබුණි. මෙය 2025 ජූලි මාසයේදී රු. බිලියන 441.4 දක්වා තවදුරටත් වැඩි වී තිබුණි.

3. මෙහෙයුම් කටයුතු සම්බන්ධ නිරීක්ෂණ

3.1 මෙහෙයුම් කරුණු

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**මූල්‍ය කල්බදු ව්‍යාපාරවල නිරත වීමට ලියාපදිංචි වී ඇති සමාගම් නියාමනය සහ අධීක්ෂණය -** මෙහෙයුම් අත්පොත්වල අවම අවශ්‍යතා, ලීසිං නිෂ්පාදන පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම සඳහා අවම ප්‍රමිතීන්, ණය තක්සේරු නිර්ණායක සහ තක්සේරුව, සාමාන්‍ය කොන්දේසි, දඩුවම් ගාස්තු, පහසුකම නැවත සැලසුම් කිරීම, අවසන් කිරීම සහ කලින් පියවීමේ ගාස්තු සහ ලීසිං ව්‍යාපාරයට අදාළව හිමිකාරිත්වය අයකර ගැනීම පිළිබඳ නිශ්චිත උපදෙස් නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) 2020 දී එකඟ වී තිබුණි. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉහත සඳහන් අංශ ආවරණය වන පරිදි විධානයක් කෙටුම්පත් කර ඇත. කෙසේ වෙතත්, එවැනි නියෝග නිකුත් නොකිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇති අතර, දඩුවම් ගාස්තු සහ කලින් පියවීමේ ගාස්තු හැර යෝජිත නියෝග 2000	මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසු, පාරිභෝගික ආරක්ෂණ රාමුව වැඩිදියුණු කිරීම සඳහා 2023 අංක 01 දරන මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි නිකුත් කරන ලදී. මූල්‍ය සේවා සමඟ සාධාරණ හා විනිවිදභාවයෙන් යුත් සම්බන්ධතාවයක් සහතික කිරීම සඳහා මූල්‍ය නිෂ්පාදන සහ සේවා සඳහා අනාවරණය කිරීමේ අවශ්‍යතා, ණය අයකර ගැනීමේ පිළිවෙත්, පැමිණිලි හැසිරවීමේ යාන්ත්‍රණ සහ අනෙකුත් යහපත් පිළිවෙත් මෙම රෙගුලාසි මගින් ආවරණය කෙරේ.	නියාමන අධීක්ෂණය සහ පාරිභෝගික ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය කල්බදු සමාගම් සඳහා මෙහෙයුම් අත්පොත්, අනාවරණය කිරීමේ අවශ්‍යතා, ණය ඇගයීම, තක්සේරුව, සාමාන්‍ය කොන්දේසි සහ

	අංක 56 දරන මූල්‍ය කල්බදු පනතට ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, වසර පහක් ගතවී ඇතත්, විධාන නිකුත් කිරීම හෝ 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතට සංශෝධන හරහා ඇතුළත් කර නොමැති බව නිරීක්ෂණය විය.	මීට අමතරව, 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතට කරන ලද සංශෝධන කෙටුම්පතෙහි, අවශ්‍ය අවස්ථාවන්හිදී, යෝජිත මූල්‍ය කල්බදු මෙහෙයුම් විධානයේ දක්වා ඇති අංග සලකා බැලිය යුතුය.	අයකර ගැනීමේ ක්‍රියා පටිපාටි පිළිබඳ නිශ්චිත උපදෙස් අවසන් කර 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතට ඇතුළත් කළ යුතුය.
(ආ)	**2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතට කරන ලද සංශෝධන (FLA) –** 2020 වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවලට ලබා දුන් ප්‍රතිචාරවලට අනුව, සංශෝධිත මූල්‍ය කල්බදු පනත කෙටුම්පත් කිරීම සඳහා දෙපාර්තමේන්තුව, තාක්ෂණික සහ මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කර පාර්ශ්වකරුවන්ගේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කළ බව සඳහන් විය. ෆිනෑන්ස් හවුස් සංගමය (FHA) සහ ශ්‍රී ලංකා ලීසිං සංගමය (LASL) වෙතින් යෝජනා ලැබුණු අතර, අවශ්‍ය නම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිපාදන පරීක්ෂා කර සංශෝධන සිදු කරනු ඇත. තවද, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2024 මැයි 05 දිනැති මාධ්‍ය නිවේදනයට අනුව, මූල්‍ය කල්බදු ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය සහ කර්මාන්ත වර්ධනයන්ට අනුකූල වන පරිදි මූල්‍ය කල්බදු පනත යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන, ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය කල්බදු පනත සංශෝධනය කිරීම ආරම්භ කර තිබුණි. පුළුල් පාර්ශ්වකරුවන්ගේ උපදේශන සඳහා, 2024 මැයි 31 වන දින හෝ ඊට පෙර කෙටුම්පත් සංශෝධන පිළිබඳ නිරීක්ෂණ/යෝජනා/අදහස් ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවට ආරාධනා කර තිබුණි. කෙසේ වෙතත්, එම සංශෝධන නීතිගත කිරීම 2025 අගෝස්තු 31 දින වන විටත් සිදු කර නොතිබුණි.	වර්තමානයේදී, දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති වැඩසටහන යටතේ අවශ්‍යතාවයක් වන 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත (FBA) සංශෝධනය කිරීමට ප්‍රමුඛත්වය දෙමින් සිටී. 2026 පළමු කාර්තුව අවසන් වන විට මූල්‍ය ව්‍යාපාර පනත සඳහා වන සංශෝධන අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. 2026 පළමු භාගය තුළ මූල්‍ය කල්බදු පනත සංශෝධන කටයුතු කඩිනම් කිරීමට සහ අවසන් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව හැකි සෑම පියවරක්ම ගනිමින් සිටී.	කර්මාන්ත සංවර්ධනයන් සමඟ කාලෝචිත ලෙස පෙළගැස්වීම සහ මූල්‍ය කල්බදු ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම සහතික කිරීම සඳහා 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතට කරන ලද සංශෝධන සිදු කර එය කඩිනමින් බලාත්මක කළ යුතුය.
(ඇ)	**බැංකුව විසින් උද්ධමන ඉලක්ක සපුරා ගැනීම -** 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(1) වගන්තිය ප්‍රකාරව, බැංකුව විසින් ළඟාකර ගත යුතු උද්ධමන ඉලක්කය දැක්වෙන මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමක් අමාත්‍යවරයා සහ බැංකුව විසින් අත්සන් කළ යුතුය. අමාත්‍යවරයා සහ බැංකුවේ අධිපතිවරයා 2023 ඔක්තෝබර් 03 දින (2023.10.05 දිනැති අංක 2352/20 දරන අතිවිශේෂ ගැසට්පත්‍රයේ ප්‍රකාශ කළ පරිදි) මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමට එළඹුණු අතර ඒ අනුව, එකඟ වූ මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ, බැංකුව කාර්තුමය මතුපිට උද්ධමන අනුපාතිකය සියයට 5	අඛණ්ඩව කාර්තු සඳහා උද්ධමනය සියයට 5 ක ඉලක්කයට වඩා සියයට 2 කට වඩා අඩුවෙන් පැවතුන බැවින්, 2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(5) වගන්තියට අනුව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කළේය. 2024 දෙවන කාර්තුවේ සිට තුන්වන කාර්තුව දක්වා, 2024 තුන්වන කාර්තුවේ සිට හතරවන කාර්තුව දක්වා සහ 2024	එකඟ වූ උද්ධමන ඉලක්කයට අනුකූල වීම අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලැබිය යුතු අතර, මුදල් ප්‍රතිපත්ති රාමුවට අනුකූල වීම සහතික කිරීම සඳහා කාලෝචිත

	ක මට්ටමේ පවත්වා ගැනීමට ඉලක්ක කර ගත යුතුය. තවද, පනතේ 26(5) වගන්තියේ අවශ්‍යතාවය සඳහා උද්ධමන ඉලක්කය සඳහා වන ආන්තිකය ප්‍රතිශතාංක +(-) 2 ක් වේ. ඒ අනුව, 2024 අවසාන කාර්තු හතර සහ 2025 මුල් කාර්තු දෙක සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද අනුරූප කාර්තුවේ මාස තුන සඳහා කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (CCPI) වාර්ෂික ප්‍රතිශත වෙනස්වීම්වල සරල සාමාන්‍යය පිළිවෙලින් සියයට 4.4, සියයට 1.37, සියයට 0.8, සියයට -1.53, සියයට -3.60 සහ සියයට -1.10 විය. අඛණ්ඩව කාර්තු දෙකක් සඳහා උද්ධමනය සියයට 5 ඉලක්කයට වඩා සියයට 2 කට වඩා අඩු මට්ටමක පැවතුන බැවින්, 2024 තුන්වන කාර්තුවේ සිට උද්ධමන ඉලක්ක උල්ලංඝනය කිරීම් නිරීක්ෂණය විය.	හතරවන කාර්තුව, 2025 පළමු කාර්තුව සඳහා, වාර්තා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර, ඒවා මහ බැංකු වෙබ් අඩවියෙන් ප්‍රසිද්ධියේ ලබා ගත හැකිය. මෙම වාර්තා මඟින් උද්ධමන උල්ලංඝනයට හේතු, යෝජිත ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග සහ ඉලක්කය සපුරා ගැනීම සඳහා ඇස්තමේන්තුගත කාල රාමුව දක්වා ඇත. 2025 පළමු කාර්තුවේ සිට දෙවන කාර්තුව දක්වා පසු විපරම් වාර්තාවක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද අතර, කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිතව ඇත. ප්‍රකාශිත වාර්තා පිළිබඳ යාවත්කාලීන කිරීම් 2025 ජනවාරි සහ ජූනි මාසවලදී රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවට ලබා දෙන ලදී. 2025 තුන්වන කාර්තුවේදී (සියයට 0.8) උද්ධමනය ඉලක්කයට වඩා අඩු මට්ටමක පැවතුන බැවින්, 2025 දෙවන කාර්තුවේ සිට තුන්වන කාර්තුව දක්වා වාර්තාවක් නියමිත වේලාවට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.	නිවැරදි කිරීමේ පියවර ක්‍රියාත්මක කර පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුතුය.
(ඇ)	**අවසරයකින් තොරව මූල්‍ය ව්‍යාපාර කරගෙන යන හෝ තැන්පතු භාර ගන්නා පුද්ගලයින්ට එරෙහිව පියවර ගැනීමේ ප්‍රගතිය -** 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 42 වන වගන්තිය ප්‍රකාරව, මුදල් ව්‍යාපාර පනතේ 2 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් තැනැත්තකු මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලැබුවේ ද හෝ කරගෙන යන්නේද හෝ තැන්පතු භාරගනු ලැබ තිබේද හෝ භාර ගන්නේ ද යනු නිසැකව දැනගැනීමේ කාර්යය සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයා විසින් ඒ සඳහා බලය දෙන ලද බැංකුවේ යම් නිලධරයකු විසින් හෝ විමර්ශනයක් පවත්වනු ලැබිය හැකි අතර, ඒ කාර්යය සඳහා මුදල් ව්‍යාපාර පනතේ දැක්වෙන ක්‍රියාමාර්ග ගනු ලැබිය හැකිය. ලබා ගත හැකි තොරතුරුවලට අනුව, 2024 සහ 2025 ජූනි 30 දක්වා කාලය තුළ ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන්	විමර්ශනයට ලක්වන පාර්ශ්වයන්ගෙන්, ඔවුන්ගේ ගනුදෙනුකරුවන්ගෙන් සහ අනෙකුත් අදාළ ආයතනවලින් තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතා මෙන්ම නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් මුදල් ව්‍යාපාර පනත (FBA) යටතේ අදාළ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විමර්ශන සැලකිය යුතු ප්‍රමාදයන්ට මුහුණ දෙයි. මෙම ප්‍රමාදයන් මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන යටතේ අවශ්‍ය පරිදි විමර්ශන කාලෝචිත ලෙස අවසන් කිරීමට බාධාවක් වේ. මෙම අභියෝගවලට මුහුණ දීම සහ මුදල්	මුදල් ව්‍යාපාර පනතේ 42 වන වගන්තිය යටතේ විමර්ශන ක්‍රියා පටිපාටි කඩිනම් කළ යුතු අතර, පොරොත්තු විමර්ශනවල ප්‍රමාදය අඩු කිරීමට සහ කාලෝචිත ලෙස නිම කිරීම සහතික කිරීමට අවශ්‍ය සම්පත් වෙන් කළ යුතුය.

විමර්ශන පැවැත්වීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

විස්තරය	2024	2025 (30.06.2025 දක්වා)
ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව	166	133
අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාර කටයුතු කිරීම / තැන්පතු භාරගැනීම සම්බන්ධ පැමිණිලි සංඛ්‍යාව	15	08
අධිකාරී බලයක් නොමැතිව මුදල් ව්‍යාපාර කටයුතු කිරීම / තැන්පතු භාරගැනීම සම්බන්ධ පැමිණිලි මත ආරම්භ කළ විමර්ශන සංඛ්‍යාව	15	08
අවසන් කළ විමර්ශන සංඛ්‍යාව (මේ තුළ 2020 සිට ආරම්භ කළ විමර්ශන ඇතුළත් වේ.)	10	09
කරමින් පවතින විමර්ශන සංඛ්‍යාවෙහි එකතුව (මෙයට 2020 සිට නිශ්චිත විමර්ශන ඇතුළත් වේ)	**123**	**121**

ඉහත වගුවට අනුව, 2025 ජුනි 30 වන විට සැලකිය යුතු විමර්ශන සංඛ්‍යාවක් විභාග වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

ව්‍යාපාර පනතෙහි 42 වගන්තිය යටතේ විමර්ශන ක්‍රියා පටිපාටි කඩිනම් කිරීම සඳහා, දෙපාර්තමේන්තුව විසින් සංශෝධන කිහිපයක් යෝජනා කර ඇති අතර, අදාළ උපදේශන පත්‍රිකාව නිකුත් කිරීමට පෙර 2025 ඔක්තෝම්බර් මාසයේදී පාලක මණ්ඩලයට ඉදිරිපත් කිරීමට සැලසුම් කර ඇත.

(ඉ) **මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් හසුරුවන ලද පැමිණිලි සහ දුක්ගැනවිලි වල ප්‍රගතිය –**
1949 අංක 58 දරන මුදල් නීති පනතේ 33 වන වගන්තියේ විධිවිධාන යටතේ සංශෝධිත පරිදි මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව (FCRD) පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම්, බලයලත් ප්‍රාථමික අලෙවිකරුවන්, ගෙවීම් සහ පියවීම් පද්ධතිවල සහභාගිවන්නන් (මූල්‍ය ආයතන හැර) සහ ග්ලෝබල් පේමන්ට්ස් ඒෂියා-පැසිෆික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්, ඩයලොග් අක්සියටා පීඑල්සී සහ මොබිටෙල් (ප්‍රයිවට්) ලිමිටඩ් වැනි ඇතැම් බැංකු නොවන ගෙවීම් සේවා

පැමිණිලිවල ප්‍රමාණය, ඒවායේ සංකීර්ණත්වය, ප්‍රතිචාර, තොරතුරු සහ ලේඛන සැපයීමට මූල්‍ය ආයතන ගන්නා කාලය සහ අදාළ පාර්ශ්වයන්ට සාධාරණ සවන්දීමක් ලබා දීමේ අවශ්‍යතාවය හේතුවෙන්, පැමිණිලි අවසන් කිරීමට ප්‍රමාණවත් කාලයක් ගත කිරීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා, තාක්ෂණය මත පදනම් වූ විසඳුම් යෙදීමට බැංකුව සැලසුම් කර ඇත.

මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් විසඳිය හැකි පැමිණිලි කාලෝචිත ලෙස විසඳීම වැඩි කිරීම සඳහා පැමිණිලි හැසිරවීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතු අතර තාක්ෂණය මත පදනම් වූ

සපයන්නන් වැනි ආයතන ඇතුළු ආයතන වලට එරෙහිව මූල්‍ය පාරිභෝගිකයින් විසින් ඉදිරිපත් කරන ලද සියලුම බාහිර පැමිණිලි භාර ගැනීම සහ බෙදා හැරීම සඳහා මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව තනි සම්බන්ධතා ස්ථානයක් ලෙස සේවය කරයි. වෙළඳපොළ හැසිරීමේ ප්‍රමිතීන් අධීක්ෂණය කිරීම, දේශීය හා ජාත්‍යන්තර වර්ධනයන් සහ හොඳම භාවිතයන්ට අනුකූලව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, අක්‍රමිකතා සහ විෂමාචාරයන්ට එරෙහිව පූර්වගාමී සහ ප්‍රතික්‍රියාශීලී පියවර ගැනීම සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ කටයුතුවල මතුවන අවදානම් හඳුනා ගැනීම සහ අධීක්ෂණය කිරීම මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවෙහි කාර්යභාරය වේ.

2024 ජනවාරි සිට 2025 ජුනි දක්වා කාලය තුළ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් හසුරුවන ලද පැමිණිලි සහ දුක්ගැනවිලිවල ප්‍රගතිය පහත පරිදි සාරාංශගත කර ඇත.

2024 සිට 2025 ජුනි දක්වා

වර්ෂය	ලද පැමිණිලි සංඛ්‍යාව	සලකා බැලිය හැකි පැමිණිලි	නිම කළ පැමිණිලි	නිම නොකළ	නිම කළ පැමිණිලි සලකා බැලිය හැකි පැමිණිලි වල ප්‍රතිශතයක් ලෙස
01.01.2024-31.12.2024	3,374	2,909	1,991	918	68
01.01.2025-30.06.2025	2,363	2,017	509	1,508	25
	5,737	**4,926**	**2,500**	**2,426**	**51**

සමාලෝචිත කාල සීමාව තුළ ලැබුණු සලකා බැලිය හැකි පැමිණිලි 4,926 න්, 2025 ජුනි 30 වන දින වන විට පැමිණිලි 2,426 ක් (සියයට 49 ක්) නොවිසඳී පැවතුණි.

විසඳුම් ක්‍රියාත්මක කළ යුතුය.

3.2 අරමුදල් ඌන උපයෝජනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් ව්‍යාපාර පනතෙහි 59 වන වගන්තියට අනුව, මූල්‍ය කරුණු පිළිබඳ මහජන දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුදල නමින් අරමුදලක් තිබිය යුතුය. තවද, මුදල් ව්‍යාපාර පනත යටතේ ලැබෙන සියලුම දඩ මුදල් අරමුදලට බැර කළ යුතු අතර, එම අරමුදලේ බැර කර ඇති මුදල්, බැංකුවේ පාලක මණ්ඩලය විසින් කලින් කලට තීරණය කරනු ලබන ආකාරයකට අරමුණු සඳහා භාවිතා කළ හැකිය. 2024 දෙසැම්බර් 31 දිනට ඉහත අරමුදලේ බැරව තිබූ ශේෂය රු. 2,795,599 ක් වූ අතර එය 2022, 2023,2024 සහ 2025 ජුනි දක්වා කාලය තුළ භාවිතා කර නොතිබුණි.	ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරයි. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් මහ බැංකුවේ අරමුදල් උපයෝගී කරගනිමින් රූපවාහිනී/ගුවන් විදුලි වැඩසටහන්, සමාජ මාධ්‍ය සහ වැඩමුළු හරහා ජාතික හා කලාපීය මට්ටමින් පවත්වනු ලැබේ. කෙසේ වෙතත්, මෙම අරමුදලේ ඉතිරි මුදල අනාගතයේදී පුළුල් මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාර සංවිධානය කිරීම සඳහා යොදා ගනු ඇත.	'මූල්‍ය කරුණු පිළිබඳ මහජන දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුදලේ' ඉතිරි මුදල, අරමුදල ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික කිරීම සඳහා, පාලක මණ්ඩලයේ අනුමැතියට යටත්ව, පාරිභෝගික දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා කඩිනමින් භාවිතා කළ යුතුය.

3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රසම්පාදන කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සතුව විශේෂිත ප්‍රසම්පාදන කළමනාකරණ අංශයක් නොමැත. 2024 නව ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 2.3 වගන්තියේ සඳහන් වන්නේ සියලුම රජයේ ආයතන ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු කැපවූ අංශයක් හෝ ඒකකයක් ස්ථාපිත කළ යුතු බවයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ එවැනි අංශයක් නොමැතිකම 2024 මාර්ගෝපදේශවල අවශ්‍යතාවලට අනුකූල නොවන බව පෙන්නුම් කරන අතර ප්‍රසම්පාදන කටයුතු ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සහ අධීක්ෂණය කිරීමට බාධාවක් විය හැකිය.	ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල විධිවිධානවලට අනුකූල වීම සහතික කිරීම සඳහා ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කර ශ්‍රී ලංකා මහ බැංකුව පියවර කිහිපයක් ගෙන ඇත. 2025.12.31 වන විට කැපවූ විශේෂිත ප්‍රසම්පාදන කළමනාකරණ අංශයක් ස්ථාපිත කිරීමේ ක්‍රියාවලියක ශ්‍රී ලංකා මහ බැංකුව නියැලී සිටී.	2024 නව ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල වීම සහ ප්‍රසම්පාදන කටයුතු ඵලදායී ලෙස සම්බන්ධීකරණය කිරීම සහතික කිරීම සඳහා කැපවූ ප්‍රසම්පාදන කළමනාකරණ අංශයක් පිහිටුවීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	2025 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රසම්පාදනයන් 2024 නව ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.1 වගන්තියට අනුකූලව සැලසුම් කර නොතිබූ අතර අදාළ ප්‍රසම්පාදන සැලසුම් සකස් කර අනුමත කර නොතිබුණි.	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකුවේ දෙපාර්තමේන්තු කිහිපයක් හරහා විමධ්‍යගත ආකාරයකින් ප්‍රසම්පාදන සිදු කරන ලදී. එබැවින්, කාලසටහනක් සහිත මධ්‍යගත දෙපාර්තමේන්තුවක් හෝ තනි ප්‍රසම්පාදන සැලැස්මක්	2024 නව ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 4.1 වගන්තියට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සැලසුම් කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

		නොමැත. කෙසේ වෙතත්, 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල අවශ්‍යතාවයට අනුකූලව, මධ්‍යම ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුවක් පිහිටුවීමේ ක්‍රියාවලියක නියැලී සිටින අතර, ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට පියවර ගනු ලැබේ.	

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම් වලින් ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) 779 ක් ස්ථාපිත කර තිබුණද, සාක්ෂාත් කර ගෙන ඇත්තේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක 609 ක් (සියයට 78) පමණි. උපායමාර්ගික අරමුණු හා සම්බන්ධ ඇතැම් ප්‍රධාන දර්ශක, සැලසුම් කළ කාල සීමාව තුළ සාක්ෂාත් කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය. ප්‍රධාන කාර්ය සාධක දර්ශක සාක්ෂාත් කර නොගැනීම, ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හෝ සම්පත් සීමාවන් පෙන්නුම් කිරීමක් ලෙස සැලකිය හැකිය. එවැනි අඩුපාඩු ක්‍රියාකාරී සැලැස්මේ සමස්ත ඵලදායීතාවයට සහ උපායමාර්ගික ඉලක්ක සපුරා ගැනීමට බලපෑ හැකිය.	2024 දී, ශ්‍රී ලංකා මහ බැංකුව සියළුම දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම් (DAP) හරහා ප්‍රධාන කාර්ය සාධක දර්ශක 779 ක් සලකා බැලූ අතර, ඉන් 10 ක් විශේෂිත තත්වයන් හේතුවෙන් බැහැර කරන ලදී. ඇතැම් ප්‍රධාන දර්ශක සම්පූර්ණයෙන් සාක්ෂාත් කර ගැනීමට නොහැකි වූ අතර, උද්ධමන ඉලක්ක හැර අනෙකුත් සියලුම මෙහෙවර-තීරණාත්මක ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා මහ බැංකුව සාර්ථකව සම්පූර්ණ කළේය. ප්‍රධාන දර්ශක (KPI) සාක්ෂාත් කර නොගැනීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනයෙන් ඔබ්බට ගිය බාහිර සාධක සහ සැලසුම් කළ ක්රියාකාරකම් වලින් හදිසි අවශ්‍යතා මත සම්පත් හරවා යැවීමය. ප්‍රතිපත්ති සමාලෝචන සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව (PRMD) ප්‍රගතිය නිරීක්ෂණය කිරීම, ප්‍රමාදයන්ට හේතු හඳුනා ගැනීම, ඒවා කළමනාකරණයට වාර්තා කිරීම, සහ ප්‍රමාද වූ ක්‍රියාමාර්ග සම්පූර්ණ වන තෙක් ඊළඟ කාර්තුමය සමාලෝචනවලදී නිරීක්ෂණය කිරීම සිදු කරන බව සහතික කරනු ලැබේ.	දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම් සහ උපායමාර්ගික අරමුණු කාලෝචිත ලෙස සම්පූර්ණ කිරීම සහතික කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත් වෙන් කිරීම සහ බාහිර සීමාවන් අවම කිරීම මඟින් ලඟාකර නොගත් ප්‍රධාන කාර්ය සාධක දර්ශක සාක්ෂාත් කර ගැනීම සඳහා පියවර ගත යුතුය.

(ආ)	2024 වර්ෂය සඳහා දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරන ලදී. සැලසුම් කළ ක්‍රියාකාරකම් කිහිපයක් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) සාක්ෂාත් කර නොගැනීම හේතුවෙන් මෙහෙයුම් කාර්යක්ෂමතාවයට බාධා වන් සිදුවීම, අභ්‍යන්තර පාලනයන්හි කාර්යක්ෂමතාව සීමා කිරීම, තාක්ෂණික වැඩිදියුණු කිරීම් ප්‍රමාද කිරීම සහ විවිධ දෙපාර්තමේන්තු හරහා උපායමාර්ගික අරමුණු සහ අපේක්ෂිත වැඩිදියුණු කිරීම් සාක්ෂාත් කර ගැනීම සීමා කිරීම ඇතුළු විභව ප්‍රතිවිපාක ඇති වී තිබේ.		
(i)	ව්‍යවහාර මුදල් ප්‍රතිප්‍රාප්ති සහ බෙදාහැරීම් ඒකකය (CRD) ඒකකය මුහුණ දෙන මෙහෙයුම් අවදානම් අවම කිරීම සඳහා අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීමේ අරමුණින් සිදු කරන ලද සැකසූ සේවා කළ හැකි මුදල් මිටි සඳහා අනුගමන පද්ධතියක් (tracking system) හඳුන්වා දීමේ සැලසුම්ගත ක්‍රියාමාර්ගය සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර නොතිබූ අතර, එමගින් අභ්‍යන්තර පාලනයන්හි කාර්යක්ෂමතාව සහ මෙහෙයුම් අවදානම් නිරීක්ෂණය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ හැකියාව සීමා විය හැකිය.	සියලුම සේවා කළ හැකි මුදල් මිටි සඳහා තීරු කේත යාන්ත්‍රණයක් භාවිතා කරමින් අනුගමන පද්ධතියක් ශ්‍රී ලංකා මහ බැංකුව සාර්ථකව ක්‍රියාත්මක කර ඇති අතර, එමගින් මිටි හඳුනාගැනීමේ සහ අධීක්ෂණයේ නිරවද්‍යතාවය සහ කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස වැඩි දියුණු වේ. වර්තමානයේ, මෙම පද්ධතිය කළමනාකරණය කරනු ලබන්නේ එක්සෙල් පාදක වේදිකාවක් හරහා වන අතර, මිටි විස්තර, තීරු කේත, දත්ත සහ චලන ඉතිහාසය ග්‍රහණය කර ගන්නා මධ්‍යගත වාර්තාවක් ලෙස ක්‍රියා කරයි. වැඩි මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් සහ හස්තමය කාර්යයන් අඩු කිරීම සඳහා ඇති හැකියාව හඳුනා ගනිමින්, බැංකුව දැන් අභ්‍යන්තර තාක්ෂණික සහාය ඇතිව මෙම තීරු කේත අනුගමන ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීමට ගවේෂණය කරමින් සිටී.	සැකසූ සේවා කළ හැකි මුදල් මිටි සඳහා තීරු කේත ලුහුබැඳීමේ පද්ධතිය, අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සහ මෙහෙයුම් අවදානම් නිරීක්ෂණය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය සමඟ සම්පූර්ණයෙන්ම ස්වයංක්‍රීය කළ යුතුය.
(ii)	(i) මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියේ (FSSNP) කාර්ය සාධනය පාදක කරගත් කොන්දේසි (PBCs) සාක්ෂාත් කර ගැනීම සහ දෙපාර්තමේන්තුවේ කාර්යයන්	2024 අප්‍රේල් 3 වන දින සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතියට (FSSNP), තැන්පතු රක්ෂණය පිළිබඳ මහජන දැනුවත්භාවය මැනීම සහ වැඩි දියුණු	අපේක්ෂිත අරමුණු කාලෝචිත ලෙස සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ

පිළිබඳ මහජන දැනුවත්භාවය වැඩි දියුණු කිරීම, මූල්‍ය අංශයේ ආරක්ෂක ශුද්ධ පියවරයන් මැනීම සහ මහජන දැනුවත්භාවය වැඩි දියුණු කිරීමේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI) සමඟ, සහ (ii) අධීක්ෂණ ක්‍රියාවලියට සුපිරි තාක්ෂණික විසඳුමක් හඳුන්වා දීමේ මූලික පියවරක් ලෙස තැන්පත්කරුවන් අනුව දත්ත රැස් කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන කාර්ය සාධන දර්ශකය සමඟ අද්විතීය හඳුනාගැනීමේ අංකයක් (UIN) යටතේ තැන්පත්කරුවන් අනුව දත්ත රැස් කිරීමේ පද්ධතියක් (DWDCS) සංවර්ධනය කිරීමෙන් තාක්ෂණික දියුණුව තුළින් අධීක්ෂණයේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මහජන දැනුවත්භාවයේ වැඩිදියුණු කිරීම් සහ අධීක්ෂණයේ තාක්ෂණික වැඩිදියුණු වීම සීමිත වී තිබුණි.

කිරීම සඳහා කාර්ය සාධනය පාදක කරගත් කොන්දේසියක් ඇතුළත් වේ. 2025 දෙසැම්බර් මාසයේ සංශෝධිත ලෝක බැංකු කාලරාමුවට අනුකූලව මහජන දැනුවත් කිරීමේ සමීක්ෂණ සමාගම ක්ෂේත්‍ර සමීක්ෂණය සිදු කරනු ලැබේ. සමීක්ෂණය ආරම්භ කිරීමේ ප්‍රමාදය ඇති වූයේ දීර්ඝ කරන ලද සමාලෝචන ක්‍රියාවලිය සහ දත්ත නිරවද්‍යතාවය සහතික කිරීමේ අවශ්‍යතාවය හේතුවෙනි. මේ අතර, 2025 සැප්තැම්බර් 30 වන දින නැවත ප්‍රචාරය කරන ලද මහජන දැනුවත් කිරීමේ උපාය මාර්ග උපදේශක ප්‍රසම්පාදනය සිදු වෙමින් පවතී. කාර්ය සාධනය පාදක කරගත් කොන්දේසිය සපුරාලීම සඳහා මහජන දැනුවත් කිරීමේ ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරකම් දෙකම පූර්ව අවශ්‍යතා වේ. 2024 දෙවන කාර්තුව අවසන් වන විට බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 32 සඳහා තැන්පතුකරු අනුව දත්ත රැස් කිරීමේ පද්ධතියේ පරීක්ෂණ ධාවනයන් සම්පූර්ණ කරන ලද අතර පසුව බලපත්‍රලාභී බැංකු වෙත ව්‍යාප්ත කරන ලදී. සමහර බැංකු දත්ත ඉදිරිපත් කිරීමේදී තාක්ෂණික ගැටළු වලට මුහුණ දුන් අතර, ශ්‍රී ලංකා මහ බැංකුව ඔවුන් සමඟ සම්බන්ධීකරණයෙන් ඒවා විසඳයි. ඊට සමගාමීව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය තොරතුරු තාක්ෂණික යටිතල පහසුකම් පිළිබඳ පරතරය විශ්ලේෂණයක් සිදු කිරීම සහ තැන්පත්කරුවන් අනුව දත්ත රැස් කිරීමේ පද්ධතිය වැඩිදියුණු කිරීම හෝ නව පුළුල් කළමනාකරණ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම නිර්දේශ කිරීම සඳහා මූල්‍ය පද්ධති ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ තොරතුරු තාක්ෂණ උපදේශකයෙකු සම්බන්ධ කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු ආරම්භ කර ඇත.

සැලසුම් කර ඇති ක්‍රියාකාරකම් කඩිනම් කිරීම සහ තැන්පත්කරුවන් අනුව දත්ත රැස් කිරීමේ පද්ධතිය පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

(iii)	විවිධ පාර්ශ්වකරුවන් විසින් මූල්‍ය සාක්ෂරතා වැඩසටහන් සඳහා භාවිතා කරන අන්තර්ගතයේ ඒකාකාරිත්වය ස්ථාපිත කිරීමේ අරමුණින් සිදු කරන ලද, සියලුම පාර්ශ්වකරුවන් සඳහා පොදු සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි ඊ-වේදිකාවක් ස්ථාපිත කිරීම සහ යාවත්කාලීන කිරීමේ සැලසුම්ගත ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර නොතිබුණු අතර, එමඟින් මූල්‍ය සාක්ෂරතා මුලපිරීම්වල ඵලදායීතාවය සීමා විය හැකිය.	සැලසුම් කළ ක්‍රියාකාරකම JICA අරමුදල් යටතේ සිදු කිරීමට නියමිතව තිබූ අතර, ඊ-වේදිකා සංවර්ධන ව්‍යාපෘතියට සහාය වීමට ඇති නොහැකියාව ඔවුන් දන්වා ඇත. අදාළ දෙපාර්තමේන්තුව විසින් මෙම මුලපිරීම ඉදිරියට ගෙන යාම සඳහා වේදිකාවේ සංවර්ධනය විභවයෙන් වෙනස් කළ කාලරාමු සමඟ ඉදිරියට ගෙන යා හැකි ශක්‍ය මාර්ග ගවේෂණය කරනු ඇත.	මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්වල ඒකාකාරිත්වය සහ ඵලදායීතාවය සහතික කිරීම සඳහා සියලුම පාර්ශ්වකරුවන් සඳහා පොදු ඊ-වේදිකාවක් ස්ථාපිත කර යාවත්කාලීන කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(iv)	කාර්යක්ෂම හා ශක්තිමත් පරිගණක පරිසරයක් තුළ කොටස්කරුවන්ට වැඩිදියුණු කළ සේවාවන් සැපයීමේ අරමුණින් සිදු කරන ලද අවශ්‍යතා විශ්ලේෂණය සම්පූර්ණ කිරීමෙන් ආරම්භ වන, ක්‍රමයෙන් අඩුවන බහු ස්ථාවර කූපන් භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුත් කිරීම පහසු කිරීම සඳහා වෙබ් පාදක භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ පද්ධතිය පුළුල් කිරීමේ සැලසුම් කළ ක්‍රියාකාරකම් සම්පූර්ණ කර නොතිබූ අතර, එමඟින් භාණ්ඩාගාර මෙහෙයුම්වල තාක්ෂණික වැඩිදියුණු කිරීම් ප්‍රමාද වීමට ඉඩ තිබුණි.	2024 දී රාජ්‍ය ණය කළමනාකරණ පනත බලාත්මක වීමත් සමඟ ණය කළමනාකරණ කාර්යාලයක් පිහිටුවීම බලාත්මක විය. එබැවින්, ණය කළමනාකරණ මෙහෙයුම් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි සිට රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය දක්වා සංක්‍රාන්ති කාලපරිච්ඡේදයක පැවතුනි. අතුරු කාල සීමාව සඳහා රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් භාවිතා කරන ලද වර්තමාන වෙන්දේසි ක්‍රමය භාවිතා කිරීමටත්, ඉන් ඉක්මනින්ම අවශ්‍ය අංගයන්ගෙන් යුත් නව අංගසම්පූර්ණ වෙන්දේසි පද්ධතියක් රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් මිලදී ගැනීමටත් තීරණය කරන ලදී. ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින්, සැලකිය යුතු සංවර්ධන උත්සාහයක් සහ පුළුල් පරීක්ෂණ අවශ්‍ය වන ප්‍රධාන වෙනස්කම් සිදු නොකළේය.	භාණ්ඩාගාර මෙහෙයුම්වල කාලෝචිත තාක්ෂණික වැඩිදියුණු කිරීම් සහතික කිරීම සඳහා වෙබ් පාදක භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ පද්ධතිය පුළුල් කිරීම කඩිනම් කිරීමට හෝ නව අංග සම්පූර්ණ වෙන්දේසි පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය.